Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2021 දෙසැම්බර් 13, කොළඹදී.

## 2019/2020 සහ 2020/2021 මූල්‍ය වර්ෂවල පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු සම්මානය නෙස්ලේ සමාගම දිනාගනී

පසුගියදා පැවති 24 වැනි ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී, 2019/2020 සහ 2020/2021 මූල්‍ය වර්ෂවල පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු සම්මානය දිනාගැනීමට නෙස්ලේ ලංකා සමාගම සමත්විය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන මෙම සම්මාන උළෙලේ අරමුණ වන්නේ, මෙරට අපනයන ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් ලබාදුන් සමාගම් ඇගයීම යි.

"ජාතික අපනයන ශක්තිමත් කිරීම සඳහා අප ලබාදෙන අඛණ්ඩ දායකත්වය මෙසේ ඇගයීමට ලක්වීම විශාල ගෞරවයක්. එමෙන්ම නොකඩවා මූල්‍ය වර්ෂ දෙකකදී, විශේෂයෙන්ම දැඩි අභියෝගකාරී කාලසීමාවකදී, පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු ලෙස සම්මාන හිමිවීම මගින් අපගේ සේවක කාර්යමණ්ඩලයේ අප්‍රතිහත ධෛර්යය හා කැපවීම මනාව පිළිබිඹු කෙරෙනවා. තව ද, දේශීය පොල් කර්මාන්තය නගාසිටුවමින් සහ පොල් ගොවීන් සඳහා තිරසාර ජීවනෝපාය මාර්ග බිහිකරමින්, අපගේ ව්‍යාපාර මෙහෙයුම් තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති ධනාත්මක බලපෑම පිළිබඳවත් මම බෙහෙවින් සතුටට පත්වෙනවා", යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනා මහතා ප්‍රකාශ කළේය.

නෙස්ලේ සමාගම මුල්වරට මැගී පිටි කළ පොල් කිරි නිෂ්පාදනය හඳුන්වාදුන්නේ 1986 වසරේදී ය. එතැන් සිට ගෙවුණු වසර 35ක කාලය තුළ ශ්‍රී ලාංකික පොල් ගොවීන් 6,000කට වැඩි ප්‍රමාණයකට සිය ජීවනෝපාය සහ යහපැවැත්ම උදෙසා නෙස්ලේ සමාගමේ සහාය හිමිව තිබේ. පසුගිය වසරේදී පමණක් සමාගම දේශීය පොල් ගොවීන්ගෙන් එකතු කරගත් නැවුම් පොල් ගෙඩි ප්‍රමාණය මිලියන 90 ඉක්මවන අතර, ඒ හරහා මෙරට ග්‍රාමීය ප්‍රජාව අතර රුපියල් බිලියන 4.5කට අධික මුදලක් බෙදාදී තිබේ. ලොව විශාලතම පිටි කළ පොල් කිරි අපනයනකරුවෙකු ලෙස 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකයට රුපියල් බිලියන 3.8ක අපනයන ආදායමක් හිමිකරදීමට ද නෙස්ලේ ලංකා සමාගම සමත්විය. ඊට අමතරව, නෙස්ලේ පොල් වගා සැලසුම ඔස්සේ ග්‍රාමීය ගොවි පවුල් 4,000කට සහාය වෙමින්, ඔවුන්ට නොමිලේ දෙමුහුන් පොල් පැළ ලබාදීමටත්, පොල් වගාව පිළිබඳ තාක්ෂණික සහාය හා විධිමත් පුහුණු හා සංවර්ධන වැඩසටහන් පිරිනැමීමටත් සමාගම කටයුතු කළේය.

"මෙම ඇගයීම පිළිබඳව අප සතුටුවෙනවා වගේම නිහතමානීව ආඩම්බර වෙනවා. අපි මීට දශක තුනකට ඉහතදී මැගී පිටි කළ පොල් කිරි නිෂ්පාදනය හඳුන්වා දුන්නේ නෙස්ලේ

ගුණාත්මක බවේ සහතිකය සමඟ පාරිභෝගිකයින්ගේ පහසුව අරමුණු කරගනිමිනුයි. ශ්‍රී ලාංකික පාරිභෝගිකයින්ගෙන් ඔබ්බට ගොස් ලොව රටවල් 50කට වැඩි සංඛ්‍යාවක පාරිභෝගිකයින්ට අපගේ නිෂ්පාදන පිරිනමමින්, ගෙවුණු දශක තුන පුරාවට අපගේ ප්‍රගමනය දෙස බැලීමේදී මම බෙහෙවින් ආඩම්බරයට පත් වෙනවා", යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ උප සභාපති- සැපයුම් දාම පන්චද්චරම් සතියේන්ද්‍ර මහතා පැවසුවේය.

ජනාධිපති අපනයන සම්මාන උළෙල යනු දේශීය අපනයන ක්ෂේත්‍රයට කැපීපෙනෙන දායකත්වයක් දැක්වූ සමාගම් ඇගයීම පිණිස සංවිධානය කරනු ලබන අතිශය ගෞරවාන්විත සම්මාන උළෙලකි. මීට ඉහතදී, 2018/ 2019 ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී ද පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු ලෙස සම්මාන දිනාගත් නෙස්ලේ සමාගම, 2018 වසරේදී පොල් මද නිෂ්පාදන අංශයේ වැඩිම විදෙස් විනිමය ඉපැයීමක් සිදුකළ ආයතනය ලෙස ද සම්මානයට පාත්‍ර විය. 2017 සම්මාන උළෙලේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අංශය තුළ වැඩිම අගය එකතු කිරීමට හිමි සම්මානය ද, 2014 සහ 2015 වසරවලදී අපනයන ආශ්‍රිත හොඳම බහුජාතික සමාගම ලෙස ද ගෞරව හිමිකරගත්තේය. එමෙන්ම, 2013 සහ 2010 වර්ෂවලදී පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු වූ නෙස්ලේ සමාගම, 2011 වසරේදී ආහාර සහ වෙනත් පාන නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු සම්මානයට ද හිමිකම් කීය.

නෙස්ලේ සමාගම වසර 115ක් පුරාවට ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට බද්ධ වී තිබේ. වර්තමානයේ ජීවත් වන ජනතාව ද, අනාගත පරපුර ද ඇතුළු සියලු දෙනාගේ ජීවිතවල ගුණාත්මක බව වැඩිකිරීම වෙනුවෙන් ආහාර සතු ශක්තිය මුදාහැරීම යන අරමුණ ඇතිව නෙස්ලේ සමාගම ක්‍රියාකරයි. එහිදී, ඉහළ විවිධත්වයකින් යුත් ආහාර සහ පාන වර්ග රැසක් මුල් ළමාවියේ සිට මහලු වියේ පසුවන අය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට නෙස්ලේ සමාගම පිරිනමයි.